# ආගමික සංවාදයක් ලෙස PK චිත්‍රපටයේ නිරූපිත ආගම හා මනුෂ්‍යත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඉරුදෙණියායේ සිරිරතන හිමි[1]

## හැඳින්වීම

ආගම මානව සමාජයේ ආරම්භයේ සිට පුද්ගල ජීවිතය, සදාචාරය, සංස්කෘතිය, දේශපාලනය සහ සමාජ සංවිධානය හැඩගස්වන සමාජ ආයතනයක් ලෙස හඳුනාගත හැකි ය. ආගමික විශ්වාස, චාරිත්‍ර, පූජා ක්‍රම සහ ආගමික ආයතන මඟින් සමාජ විනය, සාමූහික අනන්‍යතාව සහ සහජීවනය වර්ධනය කළ හැකි වුව ද, ආගම අන්ධ භක්තිය, වාණිජකරණය, අධිකාරීවාදය සහ සමාජ පාලනය සඳහා භාවිත වන අවස්ථා ද නූතන සමාජයේ දක්නට ලැබේ. සමානාත්මතාව මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අත්‍යාවශ්‍ය ය (UNFPA Sri Lanka, 2020). මෙවැනි යථාර්ථයන් සංවේදී ලෙස සන්නිවේදනය කිරීමෙහි ලා සිනමාව ප්‍රබල සංස්කෘතික මාධ්‍යයක් ලෙස ක්‍රියා කරයි. රාජ්කුමාර් හිරානි විසින් අධ්‍යක්ෂණය කරන ලද PK චිත්‍රපටය නූතන ඉන්දීය සමාජයේ ආගමික විශ්වාස, නායකත්වය, අන්ධ භක්තිය, සමාජ බලය සහ මනුෂ්‍යත්වය අතර පවතින සම්බන්ධතාව විචාරාත්මක ව නිරූපණය කරයි (Hirani, 2014). වෙනත් ග්‍රහලෝකයකින් පෘථිවියට පැමිණෙන PKගේ දුරස්ථ පාලක උපකරණය සොරකම් කිරීමෙන් පසු එය සොයාගැනීම සඳහා ඔහු විවිධ ආගම්වල දෙවියන් සෙවීමටත්, ඒවායේ චාරිත්‍ර හා පූජා ක්‍රම අනුගමනය කිරීමටත් උත්සාහ කරයි. ආගමික සම්ප්‍රදායන් පිළිබඳ පූර්ව අවබෝධයක් නොමැති ඔහුගේ නැවුම් දෘෂ්ටිකෝණය මඟින් සමාජය සාමාන්‍යකරණය කරගෙන ඇති ආගමික විශ්වාස, චාරිත්‍ර සහ අධිකාරී ව්‍යුහ ප්‍රශ්න කිරීම චිත්‍රපටයේ විශේෂත්වයකි.

## සාහිත්‍ය විමර්ශනය

මෙම අධ්‍යයනයේ සාහිත්‍ය විමර්ශනය සඳහා ලාංකේය බෞද්ධ සමාජ චින්තනය, විදේශීය සමාජ විද්‍යාත්මක ආගමික න්‍යාය සහ ඉන්දීය ජනප්‍රිය සිනමාව පිළිබඳ අධ්‍යයන සලකා බැලේ. වල්පොල රාහුල හිමියන්ගේ ශ්‍රී ලංකාවේ බුදුසසුනේ ඉතිහාසය කෘතිය ආගම, සමාජ, රාජ්‍ය, සංස්කෘතික හා ආයතනික පසුබිම් සමඟ බැඳී පවතින ආකාරය පැහැදිලි කරයි (රාහුල හිමි, 1956). බුදුන් වදාළ ධර්මය කෘතිය බුදුදහමේ විචාරශීලී, සදාචාරාත්මක හා මානවවාදී පදනම ඉදිරිපත් කරයි (රාහුල හිමි, 2008). මාර්ටින් වික්‍රමසිංහයන්ගේ බුදුසමය හා සමාජ දර්ශනය, බෞද්ධ දර්ශනය හා මාර්ගය යන කෘති බුදුදහම චාරිත්‍රානුකූල විශ්වාසයකට වඩා සමාජ දර්ශනයක්, ප්‍රායෝගික ජීවන මාර්ගයක් හා සදාචාර පද්ධතියක් ලෙස විමර්ශනය කිරීමට පදනම සපයයි (වික්‍රමසිංහ, 1948; 1968). මෙම කෘති බෞද්ධ හා සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයට න්‍යායික පදනම සපයයි.

1 තාවකාලික කථිකාචාර්ය, සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම. irudeniyayesirirathana@gmail.com

සමාජ විද්‍යාත්මක සාහිත්‍යය තුළ එමිල් ඩුර්කයිම් ආගම සමාජ ඒකීයභාවය හා සාමූහික විඥානය ගොඩනගන ආයතනයක් ලෙස විග්‍රහ කරයි (Durkheim, 1915). මැක්ස් වේබර් ආගම පුද්ගල ක්‍රියාකාරිත්වය, සමාජ සංවිධානය සහ සංස්කෘතික වටිනාකම් කෙරෙහි බලපාන සාධකයක් ලෙස පැහැදිලි කරයි (Weber, 1963). මාක්ස් ආගම සමාජ අසමානතාව, බල සම්බන්ධතා සහ මතවාදී පාලනය සමඟ සම්බන්ධ කරමින් විචාරාත්මක අදහසක් ඉදිරිපත් කරයි (Marx, 1844). බෙර්ගර් ආගම සමාජ යථාර්ථයට අර්ථයක් ලබා දෙන සංකේතාත්මක පද්ධතියක් ලෙස හඳුනාගනී (Berger, 1967). මෙම න්‍යායික පදනම් PK චිත්‍රපටයේ නිරූපිත ආගමික අධිකාරිය, අන්ධ භක්තිය, සමාජ පාලනය සහ මනුෂ්‍යත්වය සමාජ විද්‍යාත්මක ව කියවා බැලීමට උපකාරී වේ.

ඉංග්‍රීසි අධ්‍යයන කෘති අතර මලල්ගොඩගේ *Buddhism in Sinhalese Society* 1750 - 1900 කෘතිය බෞද්ධ ආගමික ආයතන, ප්‍රබෝධය සහ සමාජ වෙනස්වීම් අතර සම්බන්ධතාව පැහැදිලි කරයි (Malalgoda, 1976). ඔබේසේකරගේ The Cult of the Goddess Pattini කෘතිය ආගම, ජන විශ්වාස, දේව ඇදහිලි සහ සමාජ සංස්කෘතිය අතර පවතින සංකීර්ණ සම්බන්ධතාව විමර්ශනය කරයි (Obeyesekere, 1984). ගොම්බ්‍රිච් සහ ඔබේසේකරගේ Buddhism Transformed කෘතිය නූතන ශ්‍රී ලංකාවේ බෞද්ධ ආගමික ජීවිතය සමාජ, ආර්ථික සහ සංස්කෘතික වෙනස්වීම් සමඟ අන්තර්ක්‍රියා කරන ආකාරය පෙන්වා දෙයි (Gombrich and Obeyesekere, 1988). මෙම කෘති මඟින් PK චිත්‍රපටයේ ආගමික විවේචනය ශ්‍රී ලංකාව වැනි බහුආගමික සමාජයකට ද අදාළ කරගත හැකි බව පැහැදිලි වේ.

ඉන්දීය සිනමා සාහිත්‍යය තුළ Rachel Dwyer විසින් රචිත *Filming the Gods* කෘතිය ඉන්දීය සිනමාවේ ආගමික නිරූපණය සහ ජනප්‍රිය සංස්කෘතිය අතර සම්බන්ධතාව විමර්ශනය කරයි (Dwyer, 2006). Tejaswini Ganti - *Bollywood* කෘතිය හින්දි ජනප්‍රිය සිනමාවේ සමාජ, සංස්කෘතික සහ දේශපාලනික වැදගත්කම පෙන්වා දෙයි (Ganti, 2013). Madhava Prasad - Ideology of the Hindi Film කෘතිය හින්දි චිත්‍රපටය සමාජ ආයතනයක් සහ මතවාදී ව්‍යුහයක් ලෙස කියවා බලයි (Prasad, 1998). Ravi Vasudevan - *Making Meaning in Indian Cinema* කෘතිය ඉන්දීය ජනප්‍රිය සිනමාවේ අර්ථකථන, දෘශ්‍ය රූපක සහ සමාජ, දේශපාලන පසුබිම් විමර්ශනය කිරීමට වැදගත් වේ (Vasudevan, 2000). මේ අනුව PK චිත්‍රපටය ආගම හා සමාජ බලය පිළිබඳ විචාරාත්මක මාධ්‍යයක් ලෙස කියවීමට පදනම සපයයි.

**පර්යේෂණ ගැටලුව**

මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ PK චිත්‍රපටය තුළ ආගම හා මනුෂ්‍යත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක අදහස් නිරූපණය වන්නේ කෙසේ ද? යන්න විමර්ශනය කිරීම ය. විශේෂයෙන් ම ආගමික අධිකාරිය, අන්ධ භක්තිය, ආගමික බහුත්වවාදය, ආගමික වාණිජකරණය, මානවවාදය සහ සමාජ බල සම්බන්ධතා පිළිබඳ ව චිත්‍රපටය ඉදිරිපත් කරන පණිවිඩය මෙහි සලකා බැලේ. ආගම මනුෂ්‍යයාගේ යහපත සඳහා ක්‍රියා කරන සමාජ ආයතනයක් වුව ද, එය ආගමික නායකත්වයේ අධිකාරීවාදී භාවිතය සහ ආර්ථික අරමුණු සඳහා යොදාගැනීමේ දී මනුෂ්‍යත්වයට එරෙහි බල පද්ධතියක් බවට පත් වන්නේ ද යන්න මෙහි විමර්ශන ගැටලුව වේ.

**අරමුණු**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ PK චිත්‍රපටයේ නිරූපිත ආගම හා මනුෂ්‍යත්වය පිළිබඳ අදහස් සමාජ විද්‍යාත්මක ව විග්‍රහ කිරීම ය. එහි විශේෂ අරමුණු වන්නේ,

1. ආගම සමාජ ආයතනයක් ලෙස ඉටු කරන කාර්යභාරය හඳුනාගැනීම;
2. ආගමික නායකත්වය සහ ජන විශ්වාස අතර පවත්නා සම්බන්ධතාව විශ්ලේෂණය කිරීම
3. ආගම නාමයෙන් සිදු වන වාණිජකරණය, අධිකාරීවාදය සහ සමාජ පාලනය විමර්ශනය කිරීම
4. මනුෂ්‍යත්වය සහ ආගමික බහුත්වවාදය පිළිබඳ ව චිත්‍රපටය ඉදිරිපත් කරන පණිවිඩය හඳුනාගැනීම
5. බෞද්ධ සදාචාරය තුළ අවධාරණය කෙරෙන විචාරශීලීභාවය, කරුණාව, අවිහිංසාව සහ මානව වගකීම සමඟ PK චිත්‍රපටයේ පණිවිඩය සම්බන්ධ කර විමර්ශනය කිරීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කර ඇති අතර, PK චිත්‍රපටය ප්‍රධාන අධ්‍යයන ඒකකය ලෙස තෝරාගෙන අන්තර්ගත විශ්ලේෂණය සිදු කර ඇත. චරිත, දෙබස්, සිදුවීම්, සංකේත, දෘශ්‍ය රූපක සහ ආගමික නිරූපණ විධි විශ්ලේෂණය කරන ලදී. ද්විතීයික මූලාශ්‍රය ලෙස ලාංකේය හා විදේශීය ග්‍රන්ථ, සිනමා අධ්‍යයන භාවිතා කරමින්, විචාරශීලීභාවය, කරුණාව, අවිහිංසාව, සදාචාරය, මානව වගකීම පිළිබඳ බෞද්ධ සංකල්ප විශ්ලේෂණාත්මක පදනම ලෙස යොදාගෙන ඇත.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

PK චිත්‍රපටයේ ප්‍රධාන චරිතය ඉදිරිපත් කරන සරල ප්‍රශ්න මඟින් සමාජයේ සාමාන්‍යකරණය වී ඇති ආගමික චාරිත්‍ර හා විශ්වාස නැවත විමසා බැලීමට ප්‍රේක්ෂකයා යොමු කරවයි. විවිධ ආගම් නියෝජනය කරන පුද්ගලයන් එක ම දෙවියන් වෙනුවෙන් වෙනස් චාරිත්‍ර පවත්වාගෙන යන ආකාරය නිරූපණය කිරීමෙන්, ආගම සහ මිනිසා විසින් නිර්මාණය කරන ලද ආගමික පද්ධති අතර වෙනස හඳුනාගත හැකි ය. එබැවින් චිත්‍රපටය ආගමට එරෙහි නො ව, ආගම නාමයෙන් සිදු වන වංචාව, භීතිය, වාණිජකරණය හා අධිකාරීවාදී භාවිතයන්ට එරෙහි විචාරයක් ඉදිරිපත් කරයි.

බෞද්ධ මානවවාදී දෘෂ්ටියෙන් ආගමික ජීවිතයේ හරය වන්නේ චාරිත්‍රානුකූල ක්‍රියා පමණක් නො ව, කරුණාව, සත්‍යය, අවිහිංසාව, සාධාරණත්වය හා සමාජ වගකීම් ය. බෞද්ධ ආගමිකත්වය අන්ධ විශ්වාසයට වඩා විචාරශීලී අවබෝධය හා සදාචාරාත්මක ජීවිතය මත පදනම් වන බව රාහුල හිමි සහ වික්‍රමසිංහයන් පෙන්වා දෙති (රාහුල හිමි, 2008; වික්‍රමසිංහ, 1948). මේ අනුව PK චිත්‍රපටය ද සැබෑ ආගමිකත්වය මනුෂ්‍යත්වය තුළ පවතින බව පෙන්වා දෙයි.

චිත්‍රපටය ආගමික බහුත්වවාදය පිළිබඳ ව වැදගත් අදහසක් ඉදිරිපත් කරයි. ආගම් අතර වෙනස්කම් පැවතුණ ද, මනුෂ්‍යත්වය, ආදරය, සත්‍යය සියලු ම ආගම්වල පොදු අරමුණු විය යුතු ය. එහෙත් ව්‍යාජ ආගමික නායකත්වය හා වාණිජකරණය නිසා එම අරමුණු විකෘති වන විට ආගම සමාජ ඒකීයභාවය වෙනුවට බෙදීමක් ඇති කරයි. මෙය ඩුර්කයිම්ගේ සමාජ ඒකීයභාවය පිළිබඳ අදහසත්, මාක්ස්ගේ ආගම හා බලය පිළිබඳ විචාරයත් සමඟ සම්බන්ධ කර බැලිය හැකි ය (Durkheim, 1915; Marx, 1844).

PK සිය දුරස්ථ උපකරණය සොයාගැනීම සඳහා විවිධ ආගමික ස්ථාන වෙත යන ජවනිකා තුළ ආගමික චාරිත්‍රවල වෙනස්කම් හා පරස්පරතා නිරූපණය වේ. එක් ආගමක පිළිගත් ක්‍රියාවක් තවත් ආගමක තහනම් හෝ අනුචිත විය හැකි බව ඔහුට පෙනී යයි. ආගමික සම්ප්‍රදායන් පිළිබඳ පූර්ව අවබෝධයක් නොමැති PK මෙම වෙනස්කම් ප්‍රශ්න කිරීමෙන්, විමසීමකින් තොර ව පිළිගෙන ඇති ආගමික හැසිරීම් ප්‍රේක්ෂක විචාරයට ලක් කරයි.

“Wrong Number" සංකල්පය ආගමික අධිකාරිය පිළිබඳ ප්‍රධාන සමාජ විද්‍යාත්මක විවේචනයකි. මිනිසා හා දෙවියන් අතර සම්බන්ධතාව ඇති කරන බව පවසන ඇතැම් ආගමික නායකයන් වැරදි දුරකථන අංකයක් මෙන් ක්‍රියා කරන බව PK පෙන්වා දෙයි. ඔවුහු මිනිසුන්ගේ බිය, දුක හා අනාරක්ෂිතභාවය සිය ආර්ථික හා සමාජ බලය තහවුරු කරගැනීමට භාවිත කරති. තපස්වි මහරාජ් PKගේ දුරස්ථ උපකරණය දේව වස්තුවක් ලෙස ජනතාවගේ වන්දනාවට ඉදිරිපත් කිරීම, ආගමික සංකේත හා ජන විශ්වාස වාණිජකරණයට ලක් වන ආකාරය නිරූපණය කරයි. එමඟින් චිත්‍රපටය ආගම ප්‍රතික්ෂේප නොකර, දෙවියන්ගේ නාමයෙන් ක්‍රියා කරන ව්‍යාජ අතරමැදියන් විවේචනය කරයි.

**නිගමනය**

මෙම අධ්‍යයනය අනුව PK චිත්‍රපටය ආගමට එරෙහි නිර්මාණයක් නො ව, ආගම නාමයෙන් ගොඩනැඟෙන අවිචාරවත් විශ්වාස, භීතිය, වංචාව, වාණිජකරණය සහ අධිකාරීවාදී භාවිතයන් විවේචනය කරන සිනමා කෘතියකි. ආගම සහ මනුෂ්‍යත්වය අතර මූලික ගැටුමක් නොපවතින අතර, ගැටලුව පවතින්නේ ආගම අර්ථකථනය කිරීමේ හා ආගමික බලය භාවිත කිරීමේ ආකාරය තුළ ය. දෙවියන් සෙවීමේ ජවනිකා, “Wrong Number” සංකල්පය සහ තපස්වි මහරාජ්ගේ ක්‍රියාකාරිත්වය මඟින් මෙම විවේචනය පැහැදිලි වේ. එබැවින් ආගමික ජීවිතය මානවවාදී, විචාරාත්මක සහ සමාජ වගකීමෙන් යුක්ත විය යුතු බව චිත්‍රපටය අවධාරණය කරයි.

**ප්‍රමුඛ පද** - අන්ධ භක්තිය, ආගම, ආගමික බහුත්වවාදය, සමාජ විද්‍යාව, PK චිත්‍රපටය

**ආශ්‍රිත ග්‍රන්ථ**

රාහුල හිමි, ඩබ්ලිව්. (1956). *ශ්‍රී ලංකාවේ බුදුසසුනේ ඉතිහාසය*, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

රාහුල හිමි, ඩබ්ලිව්. (2008). *බුදුන් වදාළ ධර්මය*, කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

වික්‍රමසිංහ, එම්. (1948). *බුදුසමය හා සමාජ දර්ශනය*, කොළඹ: සරස ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ, එම්. (1968). *බෞද්ධ දර්ශනය හා මාර්ගය*, කොළඹ: සරස ප්‍රකාශකයෝ.

Berger, P. L. (1967). *The Sacred Canopy: Elements of a Sociological Theory of Religion*. New York: Anchor Books.

Durkheim, E. (1915). *The Elementary Forms of the Religious Life*. London: George Allen & Unwin.

Dwyer, R. (2006). *Filming the Gods: Religion and Indian Cinema*. London and New York: Routledge.

Ganti, T. (2013). *Bollywood: A Guidebook to Popular Hindi Cinema*. 2nd ed. London and New York: Routledge.

Gombrich, R. and Obeyesekere, G. (1988). *Buddhism Transformed: Religious Change in Sri Lanka*. Princeton: Princeton University Press.

Hirani, R. (Director). (2014). *PK* [Film]. Mumbai: Vinod Chopra Films and Rajkumar Hirani Films.

Malalgoda, K. (1976). *Buddhism in Sinhalese Society 1750–1900: A Study of Religious Revival and Change*. Berkeley: University of California Press.

Marx, K. (1844). "A Contribution to the Critique of Hegel's Philosophy of Right." Deutsch-Französische Jahrbücher.

Obeyesekere, G. (1984). *The Cult of the Goddess Pattini*. Chicago: University of Chicago Press.

Prasad, M. M. (1998). *Ideology of the Hindi Film: A Historical Construction*. Delhi: Oxford University Press.

United Nations Population Fund Sri Lanka (2020) 'Equity in sexual and reproductive health and rights', 4 August. Available at: https://srilanka.unfpa.org/en/news/equity-sexual-and-reproductive-health-and-rights-0.

Vasudevan, R. S. (ed.). (2000). *Making Meaning in Indian Cinema*. New Delhi: Oxford University Press.

Weber, M. (1963). *The Sociology of Religion*. Boston: Beacon Press